**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදල - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- තත්ත්වාගණනය කළ මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 22 ඡේදයේ සඳහන් කොන්දේසි සපුරා නොමැති විටක ප්‍රතිපාදන හඳුනා නොගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩල පුහුණු හා අධ්‍යාපන කටයුතු, ක්‍රීඩා, විනෝද, සුහසාධන සහ ප්‍රශංසාත්මක කටයුතු යනාදිය වෙනුවෙන් රු.200,000ක් හා පරිපාලන වියදම් ලෙස රු.256,784ක මුදලක් වියදමක් ලෙස හඳුනාගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත. | පරිපාලන වියදම් වෙන් කිරීමේ නිරීක්ෂණය හා එකඟ වේ.<br>අදාළ පුහුණු, ප්‍රශංසාත්මක ඇගයීම්, සුභසාධන/විනෝද කටයුතු සඳහා වෙන් කරන ලද මුදල් 2020/2021 කාලයන්හි පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නොපැවැත්වූ අතර එම මුදල් වලින් ඉදිරි කාලයේදී වැඩසටහන් පැවැත්වීම කෙරෙහි පාලක මණ්ඩලයේ අවධානය යොමු වී ඇත.<br>එවැනි වැඩසටහන් පැවැත්වීමට, අදාල වර්ෂයේ ලාභයෙන් වැය කිරීමට සිදුවන බැවින් මෙම වෙන් කිරීම් සිදු කර ඇති බව පෙන්වා දෙමි.<br>එම මුදල් වියදම් කිරීමක් සිදු කරන්නේ නම් ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතියකින් අනතුරුව එසේ වියදම් සිදු කරනු ලබන බවද දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කිරීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මෙහෙයුම් වියදම්වලට අදාළ උපචිත වියදම් ගැලපීමෙන් පසු වර්ෂයට අදාළ වියදම සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වූ මෙහෙයුම් වියදම අතර රු.126,798ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021-1 කාර්තුවේ නොබෙදි ඉතිරි වූ දිරි දීමනා වන රු.126,034.00ක මුදල සමුච්චිත අරමුදලට මාරු කිරීම ගිණුම්ගත කිරීමත්, නිලධාරියකු විසින් ආපසු ගෙවිය යුතු මුදලක් සඳහා රු.76.00 ක මුදලක් වැඩිපුර දිරි දීමනා ගිණුමේ තැන්පත් කිරීමත් මෙම වෙනසට හේතු වූ බව පෙන්වා දෙමි. | නිවැරදිව ගණුදෙනු ලෙජරයට පිටපත් කිරීම හා නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරීම. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 ජූනි 17 දිනැති අංක පීඊඩී/3/2015 භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව, රාජ්‍ය ව්‍යවසායන්හි පාලක මණ්ඩල සඳහා දිරිදීමනා ගෙවිය හැකි ආයතන වෙන් වෙන් වශයෙන් හඳුනා ගෙන තිබුණද, මෙම අරමුදල එලෙස පාලක මණ්ඩල දීමනා ගෙවිය හැකි අරමුදලක් ලෙස හඳුනාගෙන නොතිබුණි. එසේ වුවද, නෛතික අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී පාලක මණ්ඩල දීමනා ලෙස ගෙවා තිබුණු රු.114,000ක මුදල තහවුරු කර ගැනීම සඳහා පාලක මණ්ඩල පැමිණීමේ ලේඛනයද විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | විගණකාධිපති වාර්තාව හා එකඟ වෙමි.පාලක මණ්ඩල පැමිණීමේ ලේඛණයක් පවත්වාගන යාමට කටයුතු කරමි. | නෛතික අනුමැතියක් සහිත ගෙවීම් පමණක් සිදු කිරීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877 (2) (ඇ) | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | මාර්ගෝපදේශ 04 අනු ඡේද 01 | අරමුදලේ සියලු ලැබීම් හා ගෙවීම් විධිමත්ව මූලාශ්‍ර ලේඛන පදනම් කරගෙන සුදුසු උපයෝගී ලෙජර් පොත්වල හා ලෙජර් ගිණුම්වල සටහන් කලයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අරමුදලට අදාළව විධිමත් ලෙස ලෙජර ගිණුම් සහ ජර්නල් සටහන් පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 1 කොටසෙහි 15.1 ඡේදය යටතේ මුදල් රෙගුලාසි 877 (2) හි (ඇ) මාර්ගෝපදේශ 02 අනු ඡේද 01 හා මු.රෙ.445 අනුව ගනුදෙනුවල ස්වභාවය අනුව උපයෝගී ලෙජර් ලෙස මුදල් පොත, පොදු ලෙජරය, ජර්නල් සටහන්, ආයෝජන ලේඛනය, ලැබීම් ලේඛනය හා ගෙවීම් ලේඛනය පවත්වාගෙන යන බව දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගැනීම. |
| (ii) | මාර්ගෝපදේශ 04 අනු ඡේද 03 | අයවැය ඉලක්ක ළඟාවීම පිළිබඳ වාර්තාව, ක්‍රියාකාරී සැලැස්මට අදාළ කාර්තුමය ප්‍රගතිය පිළිබඳ වාර්තාව යනාදී වාර්තා කාර්තුව අවසන් වී දින 15කට පෙර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, එම වාර්තා කිසිවක් සමාලෝචිත වර්ෂය තුළ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂයේ පළමු කාර්තු 3හි කාර්තු වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වුවත් 4 වන කාර්තුවේ කාර්තු වාර්තාව නිවැරදි දිනට ඉදිරිපත් කර ඇති බව දන්වමි. | -එම- |
| (iii) | මු.රෙ 877 (1) (ඇ) | කිසියම් වර්ෂයක් සඳහා අනුමත කරන ලද අයවැයකින් තොරව අරමුදල යටතේ කිසිඳු වියදමක් දැරිය නොහැකි වුවද, සමාලෝචිත වර්ෂයේ සඳහා විගණන ගාස්තු 2022 අයවැය ලේඛනය මඟින් ද ඇස්තමේන්තු කර දක්වා නොතිබුණි. | 2022 වසරට අදාළ විගණන ගාස්තු ගෙවීමට පරිපාලන වියදම් වෙන් කිරීම ප්‍රමාණවත් බව දන්වමි. වර්ෂ 3කට අයත් විගණන ගාස්තු ගෙවීම සඳහා වන ඉල්ලීම මත එකවර වර්ෂ 3ක විගණන ගාස්තු ගෙවීම 2021 වර්ෂයේ සිදුකර ඇත. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,946,579ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,089,187ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,142,608ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වාර්ෂික ආදායමේ රු.12,254,755ක අඩුවීමත්, මෙහෙයුම් වියදමේ රු.10,261,972ක අඩුවීමට වඩා පරිපාලන වියදම් හා අනෙකුත් වෙන්කිරීම් හි රු.695,750ක වැඩිවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ III වන කාර්තුවේ දිරිදීමනා ලෙස රු.11,943,493ක මුදලක් ගෙවා තිබුණ ද, ඒ සඳහා ලබාගත් නිශ්චිත අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2021 වර්ෂයේ i, ii, iii හා iv යන සියළු කාර්තු වලට අදාළ ගෙවීම් සිදු කිරීම සඳහා අනුමැතිය ලබා ගෙන ඇති බව දන්වමි.<br><br>2021 තෙවන කාර්තු රැස්වීම් වාර්තාවේ අදාල කාර්තුව iv ලෙස හා ගෙවීම සඳහා අනුමැතිය ලබා දුන් මුදල රු.8,149,600ක් ලෙස සටහන්වීම අතපසු වීමකින් සිදුවී ඇති අතර එහි කාර්තුව, iii ලෙස හා ගෙවීම සඳහා අනුමැතිය ලබා දුන් මුදල රු.11,943,493ක් ලෙස නිවැරැදි විය යුතු බව කාරුණිකව දන්වමි. | පාලක මණ්ඩල තීරණ නිසි අනුමැතියක් සහිතව ක්‍රියාත්මක කළ යුතු වීම. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 අංක 04 දරන මෝටර් වාහන (ත්‍යාග දිරිදීමනා අරමුදල) නියෝග මාලාවේ 03 (1) නියෝගය පරිදි ත්‍යාග හා දිරිදීමනා සඳහා සුදුසුකම් ලබන ක්‍රියාකාරකම් 04ක් දක්වා තිබුණු අතර ඉන් පහත පරිදි ත්‍යාග සඳහා වූ ක්‍රියාකාරකම් 03ක් වෙනුවෙන් අරමුදල ආරම්භයේ සිටම ගෙවීම් සිදුකර නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය. ඒ අනුව අරමුදලෙන් අපේක්ෂිත අරමුණු ඉටුවීම සතුටුදායක මට්ටමක නොවුණු බව නිරීක්ෂණය විය. | (අ) (ආ) (ඇ) සම්බන්ධයෙන් කටයුතුකිරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරුන්, සහකාර කෙමසාරිස් (කාර්මික) හා නීති නිලධාරී ගෙන් සැදුම්ලත් විශේෂිත ඇගයීම් | අරමුදලේ මූලික පරමාර්ථ පිළිබඳව වැඩි අවධානයක් යොමු කර කටයුතු කළ යුතු වීම |

| | |
|---|---|
| (අ) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව යම් මෝටර් රථයක් සකස් කිරීමේ, නිෂ්පාදනය කිරීමේ, එකලස් කිරීමේ, අළුතින් නිර්මාණය කිරීමේ, අනුවර්තනය කිරීමේ, විකරණය කිරීමේ හා නිර්මාණය වෙනස් කිරීමේ නියුක්තව සිටින තැනැත්තන් පිළිබඳ තොරතුරු සපයන පාර්ශවයන් වෙත මුදල් ගෙවීම.<br><br>(ආ) ඇතැම් සාවද්‍ය ක්‍රියා හඳුනාගැනීම සඳහා තොරතුරු සපයනු ලබන හෝ එවැනි සාවද්‍ය ක්‍රියා අනාවරණය කර ගැනීමේ යෙදී සිටින තැනැත්තන්ට ත්‍යාග මුදල් ගෙවීම.<br><br>(ඇ) ප්‍රශංසාත්මක හෝ විශේෂ ඇගයීමක් අවශ්‍ය වන්නා වූ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරකම් සඳහා වර්ෂයකට රු.50,000ක් නොඉක්මවන පරිදි මුදල් ගෙවීම. | කමිටුවක් පත් කරන ලද අතර එහි නිර්දේශ මත ඉහත ගෙවීම් සිදු කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |

## 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් 12 කට අදාලව අයවැයගත අගයන් හා තත්‍ය අගයන් අතර සියයට 19ක සිට සියයට 100ක් දක්වා අතර පරාසයක විචලනයක් නිරීක්ෂණය වීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන ක්‍රමයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය. | ආදායමේ අඩුවීමට වාහන ආනයනය සීමා කිරීමේ රජයේ ප්‍රතිපත්ති තීරණය හා කොවිඩ් වසංගත තත්ත්වය හේතු වූ අතර පොළී ආදායම අඩුවීමට රජය විසින් 2020 වර්ෂයේ පැවති පොළී අනුපාත පහත හෙළීම හේතු වූ බව දන්වමි.<br><br>රට තුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කාර්ය මණ්ඩල රැස් කිරීම් සිදුකළ නොහැකි වීම නිසා කාර්ය මණ්ඩල පුහුණු හා ක්‍රීඩා හා ප්‍රශංසාත්මක හෝ විශේෂ ඇගයීම් කමිටුවට වාර්තා නොවීම ක්‍රීඩා හා පුහුණු සඳහා වෙන්කිරීමේ විචලනයට හේතු වූ අතර පාලක මණ්ඩල සංග්‍රහ වියදමේ විචලනයට වසර තුල පැවැත්විය යුතු අවම රැස්වීම් වාර සංඛ්‍යාවක් පමණක් පැවැත්වීමත්, පාලක මණ්ඩල සාමාජික සංඛ්‍යාව අඩුවීමත් පාලක මණ්ඩල සංග්‍රහ වියදම් අවම වශයෙන් දැරීමත් හේතු වූ බව කාරුණිකව පෙන්වා දෙමි. | තාත්ත්වික අයුරින් අයවැය සංඛ්‍යා තීරණය කිරීම. |